ආනන්ද ධර්මප්‍රිය ජයසේකර,
වැඩසටහන් කළමනාකරු,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
ananda@tisrilanka.org
anandadj@gmail.com
2016 ජූලි 25

නීතිඥ ලක්ෂාන් ඩයස් මහත්මා,
ගරු සභාපති,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
5/1, එලිබෑන්ක් පාර,
කොළඹ 05,

මහත්මයාණෙනි,

**අකටයුතුනාදනයේ යෙදීම නිසා මුහුණදීමට සිදුවී ඇති පෞද්ගලික පළිගැනීම් පිළිබඳව දැනුම්දීමයි**

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සංවිධානයේ නිර්වචනය අනුව '' දූෂිත '' යැයි අපිට හැඟීගිය, එසේම අපගේ විශ්වාසය අනුව ට්‍රානස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා (TISL) හි දක්ම සහ මෙහෙවරට පටහැණිව හා ආයතනයේ කීර්තිනාමයට ඉතාම හානිදායී ලෙස සිදුවෙමින් පැවැති බලවත් අක්‍රමිකතා සම්බන්ධයෙන් මමත්, තවත් කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුත් විසින්, කාර්ය මණ්ඩල සේවකයින්ට ''අකටයුතුනාදනයට ඇති අයිතිය'' යටතේ ඔබ වෙත ඉදිරිපත් කරන ලද ලිඛිත පැමිණිල්ල හා ඒ සම්බන්ධයෙන් ගොනුකළ සාක්ෂි සහ එම ක්‍රියාමාර්ගවලට යාමෙන් පසුව මට මුහුණදීමට සිදුවූ රැකියා තර්ජන/ පළිගැනීම් පිළිබඳව ගරු සභාපතිතුමා වශයෙන් ඔබතුමන්ටද පිටපත් (e mail) සහිතව 2016- 06- 30 දාතමින් ඉදිරිපත් කරන ලද ලිපි දෙක හා බැදේ.

'' 2016 - ජූලි 01 දින සිට ඉදිරි කාලය සඳහා සේවා කොන්ත්‍රාත්තුව '' යන ශීර්ෂය යටතේ 2016 - 06-30 දාතමින් ඉදිරිපත් කරන ලද එම ලිපි දෙක සම්බන්ධයෙන් සති 03ක කාලයක් ඉක්මවන තුරුත් විධායක අධ්‍යක්‍ෂවරයා හෝ වෙනත් කිසිවකු මා වෙත කිසිදු ප්‍රතිචාරයක් දක්වා නැත. මාගේ ලිපියේ අන්තර්ගතයේ කිසියම් හෝ වැරදි කරුණක් සඳහන්ව තිබිණි නම් ඒ බව කීමට සති 03ක කාලයක් ප්‍රමාණවත් බැවින් ඔවුන්ගේ නිහඬතාවය අනුව පෙනීයන්නේ කරුණුමය වශයෙන් මා සඳහන් කර ඇති කිසිවක් විධායක අධ්‍යක්‍ෂවරයා හෝ පරිපාලන කළමනාකාරිනිය ප්‍රතික්ෂේප නොකරන බවයි.

ආයතනයේ කාර්ය මණ්ඩලය තුළ සිටින අකටයුතු නාදකයින් අතර සාකච්ඡා වෙමින් පවතින, සත්‍ය හා නිරවද්‍ය යැයි විශ්වාසය තැබිය හැකි තොරතුරු අනුව පසුගිය ජූනි 30 වැනිදා මට මුහුණදීමට

සිදුවූ ඉතාම පහත් මට්ටමේ, අප්‍රසන්න සිදුවීමේ ඊළඟ පියවරට මේ මස අවසානයේ නැවත මුහුණ දීමට සිදුවන බව හැඟී යන බැවින් හා මෙය රැකියාව සම්බන්ධයෙන් සාමාන්‍ය තත්ත්වයක් නොව පෞද්ගලික පළිගැනීමක් බවට මා දැඩිව විශ්වාස කරන බැවින් ගරු සභාපතිවරයා වශයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා  මෙම ලිපිය ඔබතුමන් වෙත ඉදිරිපත් කරමි.

1) විධායක අධ්‍යක්ෂ අසෝක ඔබේසේකර මහතා හා මා අතර කිසිදු පෞද්ගලික අමනාපයක් නොතිබූ අතර ජූනි 30 වෙනිදා හමුවේදී ඔහු හැසිරුණු විලාශයෙන් දිගින් දිගටම පෙන්නුම් කළේ ඔහු මා සමඟ දැඩි තරහකින්/වෛරයකින් පසුවූ බවයි. ඒ අවස්ථාව වන විට විධායක අධ්‍යක්ෂවරයා වශයෙන් ඔහුට එරෙහිව ඉදිරිපත්ව තිබූ දූෂණ චෝදනා ඇතුළු අක්‍රමිකතා පිළිබඳ විමර්ශන කටයුතු ඇරඹී තිබූ අතර ඔහු මා වෙත දක්වූ රළු ප්‍රතිචාරය ''අකටයුතුනාදකයෙකුට" එරෙහිව එල්ල කළ ප්‍රතිචාරයන් ලෙස සැලකීමට මට සිදුවේ. ආයතනය තුළ දූෂිත තත්ත්වයන් පවතී නම් එය වැලැක්වීමට/නිවැරදි කිරීමට කටයුතු කිරීම මගේ වගකීමක් විනා වරදක් ලෙස මා නොසලකන අතර විශේෂයෙන්ම ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා වැනි දූෂණ විරෝධය පිළිබඳ පුරෝගාමී ආයතනයක් තුළ දූෂණයට එරෙහිව ක්‍රියාත්මකවීම කිසිසේත්ම වරදක් විය නොහැකිය.

2) ජූනි 30 වෙනිදා පැවැති සාකච්ඡාවේදී විධායක අධ්‍යක්ෂවරයා මා වෙත දැනුම්දුන්නේ ඉදිරි ක්‍රමෝපායික සැළැස්ම (strategic plan 2016-2020) ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කණ්ඩායම සාකච්ඡා කර තීරණය කිරීම ඊළඟ සතියේ කළමනාකරණ කමිටුවේදී සිදුවන  බවයි. එසේම එම කාර්යය, කළමනාකරණ කමිටුව තුළ ඒ ඒ වැඩසටහන් භාරව වගකීම් දරන ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්/කළමනාකරුවන්ගේ සහභාගිත්වය ඇතිව ඉතාම සාධාරණ, පිළිගත් ප්‍රමිතීන් යටතේ සිදුකෙරෙන බවයි.

මෙම කරුණු පිළිබඳව සාකච්ඡාවක් ඊළඟ කළමනාකරණ කමිටුව තුළ සිදුවී ඇති අතර එහිදී සමහර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මාගේ අවශ්‍යතාව පිළිබඳව අවධාරණය කෙරී ඇති කරුණු කළමනාකරණ කමිටු වාර්තාවෙන් ඉවත් කරන ලෙස විධායක අධ්‍යක්ෂවරයා දැඩි බලපෑම් කරමින් සිටින බව ඉතා විශ්වසනීය මූලාශ්‍රයන් කිහිපයකින්ම මට දැනගන්නට ලැබී තිබේ. එසේම ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කණ්ඩායම තීරණය කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ට මේ වන විට දැඩි බලපෑම් එල්ල වී ඇති බවද දැනගන්නට තිබේ.

ආයතනයේ සිටි පැරණි සේවකයින්ගේ සේවය අවසන් කොට ඇති කරගත් පුරප්පාඩු වෙනුවෙන් ඉතාම දූෂිත ක්‍රමවේද ඔස්සේ ආයතනයට බඳවා ගත්, විධායක අධ්‍යක්ෂවරයාගේ සුවිශේෂී බැඳියාවන් සහිත කිහිප දෙනා සඳහා ඉදිරි වැඩ සැළසුමේ ප්‍රමුඛ වැඩ කොටසක් භාරදී ඔවුන් ඔසවා තබමින්, ඔවුන්ට වසර කිහිපයක් සඳහා රැකියා සුරක්ෂිතභාවයක් ලබාදීමේ  කුඨ සැළැස්මක්ද මීට සමගාමීව ක්‍රියාත්මක වෙමින් පැවතීම මෙවැනි තත්ත්වයක් ඇතිවීමට ප්‍රධාන හේතුව බව මගේ විශ්වාසයයි. එම දූෂිත බඳවාගැනීම් හා බඳවා ගැනීමෙන් පසුව සිදුවූ විවිධාකාරයේ පක්ෂග්‍රාහී හා විශේෂ සැළකිලි, විදෙස් පුහුණුවීම් පිළිබඳව අකටයුතුනාදකයින් වශයෙන්, (එම කටයුතු සිදුවීමට පෙර සිටම) ගරු සභාපතිවරයා ලෙස ඔබතුමන් දැනුම්වත් කර ඇති බැවින් නැවත ඒ පිළිබඳ විස්තර මෙහි ඇතුළත් නොකරමි.

මෙම තැනැත්තන් අතරින් සමහර අය බඳවාගන්නා ලෙස අධ්‍යක්ෂවරුන්ද ප්‍රසිද්ධියේ බලපෑම් කර ඇති තත්ත්වයක් යටතේ, ස්වාධීන හා අපක්ෂපාතී පරීක්ෂණයක් ඔස්සේ මෙම තත්ත්වයන්ගේ වෙනසක් ඇතිවුවහොත් මිස මෙම කුඨ සැළසුම් මෙලෙසම ක්‍රියාවට නැන්වීම ස්ථිර බවද මගේ විශ්වාසයයි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ කාර්ය මණ්ඩලය සහ විශේෂඥයන් එක්ව ඉදිරි වසර පහක කාලයක් සඳහා සාර්ථක ක්‍රමෝපායික සැළසුමක් සකස් කළ හැකි නම්, එම වැඩසටහන් ක්‍රියාවට නැන්වීම පිළිබඳව හා ඒ ඒ කාර්යයන් වඩාත් සාර්ථක ලෙස ඉටු කිරීමට අවශ්‍ය කණ්ඩායම පිළිබඳව සාමූහිකව සහ විවෘතව සාකච්ඡා කරමින් එම වගකීම් බෙදාගත නොහැක්කේ ඇයි?

මා දැඩිව විශ්වාස කරන්නේ ඊට හේතුව විධායක අධ්‍යක්ෂවරයාට ''සැඟවුණු න්‍යාය පත්‍රයක්'' තිබීම බවය.

ඉතිහාසය තුළ අවස්ථා කීයක් අප මෙවැනි අභ්‍යාස සාර්ථකව ඉටු කරමින් ඒ පිළිබඳ විශේෂඥ දැනුම හා අත්දැකීම් ලබාගෙන ඇත්ද? ආචාර්ය චාරිකා මාරසිංහ, ආචාර්ය ගෝපා කුමාර්, ජ්‍යෙෂ්ඨතම පරිපාලන සේවා නිලධාරියෙකු වන පියතිස්ස රණසිංහ වැනි විශේෂඥයන් සමඟ මෙවැනි කාර්යයන්හි නිරතවෙමින් අප අපගේ ජීවිතවලට නව අත්දැකීම් එකතු කරගෙන ඇත්ද?

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ පුහුණුකරුවන් වශයෙන්, එම දැනුම සහ අත්දැකීම් පාවිච්චි කරමින් පළාත් පාලන වැඩසටහන්, සිවිල් සමාජ වැඩසටහන් ආදී විවිධ ක්‍රියාකාරකම්වලදී අප ලැබූ අත්දැකීම් අන්‍යයන් සමඟ බෙදා ගනිමින් මාර්ගෝපදේශ ලබාදී ඇත්ද? එවැනි කණ්ඩායමකට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය තුළ මෙම ක්‍රමවේද පාවිච්චි කිරීමට නොහැකි වී ඇත්තේ ඇයි?

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා වැනි ආයතනයක ඉදිරි ක්‍රමෝපායික සැළසුමක් ක්‍රියාවට නැංවීමට සුදුසු පිරිස් හඳුනාගැනීම වැනි වැදගත් කාර්යයක් සම්බන්ධයෙන් ''සැඟවුණු න්‍යාය පත්‍රයක්'' පැවතිය හැකිද? එවැන්නක් පැවතිය යුතුද?

3) මා දැනට විශේෂයෙන් ඉටු කරමින් සිටින දූෂණ විරෝධී සන්ධානය (CAC) සමඟ සිදුකරන වැඩසටහන්වලට අතිරේකව සිවිල් සමාජ සංවිධාන හා පළාත් පාලන වැඩසටහන්, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ වැඩසටහන් ආදී විවිධ ක්‍රියාකාරකම් රැසක් ඉදිරි ක්‍රමෝපායික සැළසුමට ඇතුළත්ව තිබියදී, MFA වැඩසටහන් හා සෙසු ව්‍යාපෘති ක්‍රියාවට නංවන කණ්ඩායමට මා ඇතුළත්කොට නැත. කාර්ය මණ්ඩලයේ වැටුප් වෙන්කරමින් ව්‍යාපෘති යෝජනා (අය-වැය) සැකසීමේදී විධායක අධ්‍යක්ෂවරයාගේ විශේෂ දැනුම්දීම මත (අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන තිබියදීත්) මගේ වැටුප් එම ව්‍යාපෘති යෝජනාවෙන් කපා හැර ඇත. ඒ අතර විධායක අධ්‍යක්ෂවරයාගේ සුවිශේෂී බැඳියාවක් සහිත, සැබෑ රැකියා අවධානමක් තිබිය යුතු පුද්ගලයන් ලබන වසරේ ජූනි මාසය තෙක් සුරක්ෂිත කිරීමටද ඔහු විශාල වෙහෙසක් දරා තිබේ. මා ඉටු කරමින් සිටින කාර්යයන් MFA ව්‍යාපෘති යෝජනාවට ඇතුළත්ව තිබියදී මගේ වැටුපෙන් කවර හෝ ප්‍රතිශතයක් MFA යෝජනාවට

ඇතුළත් නොවීම හා මගේ වැටුප ඇතුළත්ව සැකසූ ව්‍යාපෘති අය-වැය වෙනස්කරන ලෙස දැඩි බලපෑම් කිරීම පෞද්ගලිකව මා කෙරෙහි වෛරයකින් හා මූල්‍ය ප්‍රතිපාදන නොමැති බව පවසා මාගේ සේවය අවසන් කිරීමේ සැඟවුණු න්‍යාය පත්‍රයකින් යුතුව ක්‍රියාවට නංවා ඇති කූට සැලසුමක් බවට මම චෝදනා කරමි.

ගරු සභාපතිවරයා වශයෙන් මේ පිළිබඳව සොයා බැලීමෙන් හා ලේඛන පිරික්සීමෙන් ඔබට මෙම චෝදනාවල සත්‍යඅසත්‍යතාව තහවුරු කරගත හැකිය. එසේම, මූල්‍ය අර්බුදයක් වළක්වා ගැනීම සඳහා පසුගිය කාලය තුළ කාර්ය මණ්ඩලය වශයෙන් අප (මා ඇතුළු තවත් කිහිප දෙනෙක්) ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම හා ඒ සඳහා සබඳතා ඇති කරගැනීම වෙනුවෙන් ලබාදුන් ඇතැම් දායකත්වයන් ඉදිරියේ විධායක අධ්‍යක්ෂවරයා ඉතා නොසැළකිලිමත් ලෙස ක්‍රියාකරමින් එම අවස්ථා ආයතනයට අහිමි කළ බවද ප්‍රකාශ කළ යුතුව තිබේ.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ක්‍රියාත්මක කළ පළාත් පාලන වැඩසටහන් පිළිබඳව දැඩි පැහැදීමකින් යුතුව ආයතනයට පැමිණ මා සහ නීතිඥ ජගත් ලියනආරච්චි මහතා සමඟ දීර්ඝ සාකච්ඡාවක නිරත වූ CAFOD සංවිධානයේ නියෝජිතයෙකු වූ මහින්ද ගුණරත්න මහතා එම සාකච්ඡාවේ තොරතුරු එංගලන්තයේ CAFOD ආධාරක කණ්ඩායමට දැනුම්දී ශ්‍රී ලංකාවට පැමිණ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයා සමඟ වැඩිදුර සාකච්ඡාවකට අවස්ථාවක් ලබාදෙන ලෙස ඉල්ලා සතියකට පෙර එවන ලද ඊ-මේල් පණිවිඩයට කිසිදු ප්‍රතිචාරයක් නොදක්වා මඟහැරීම (eg: equest for a meeting with CAFOD team 2016 June 07), කාර්ය මණ්ඩලයේ දායකත්වය ඇතිව සැකසූ පළාත් පාලන වැඩසටහන් පිළිබඳ ව්‍යාපෘති යෝජනාව නියමිත කාලය තුළ ඉදිරිපත් නොකිරීම නිසා අපතේ යාම ආදිය ඊට නිදසුන්ය. (මෙම වැඩසටහන් දෙකම මට සුවිශේෂී දායකත්වයක් ලබාදිය හැකි පළාත් පාලන ක්ෂේත්‍රයට අයත්වීම නිසා එම නොසැලකිළිමත්භාවය ගැන යම් සාධාරණ සැකයක්ද මට ඇතිවේ.)

මෙවැනි තව බොහෝ කරුණු සාක්ෂි සහිතව ඉදිරිපත් කළ හැකි වුවත් රටේ දූෂණ මැඩලීම සම්බන්ධයෙන් අපට කරන්නට ඇති බොහෝ දේ පසෙක තබා අභ්‍යන්තර දූෂණ හා අක්‍රමිකතා පිළිබඳව මෙලෙස ලිවීම, ඒවා කියවමින් හා විමර්ශනය කරමින් තවත් විශාල කාලයක් ගත කිරීමට සැළැස්වීම මා හට කරගන්නා හානියක් මෙන්ම කාර්ය බහුල පුද්ගලයෙකු ලෙස ඔබටද කරන හානියකි.

අකටයුතුනාදකයන් වශයෙන් අපගේ පැමිණිල්ල ඉදිරිපත් කිරීමට පෙරද අපි ඉහත කරුණ පිළිබඳව දීර්ඝව සාකච්ඡා කළෙමු. අවසානයේ එම පැමිණිල්ල ඔබ වෙත ඉදිරිපත් කිරීමට තීරණය කළේ තත්ත්වය දිනෙන් දින වඩාත් උග්‍රවන විට, එම දූෂිත භාවිතයට එකතුවීම හෝ ඊට එරෙහිවීම යන දෙකෙන් එකක් තෝරාගැනීම හැර විකල්පයන් නොමැති තත්ත්වයක් උද්ගත වූ විටය. එම පැමිණිල්ල සම්බන්ධයෙන් දැනට මාස තුනකට ආසන්න කාලයක් තිස්සේ ඔබතුමන්ටත්, පැමිණිලිකරුවන් වශයෙන් අපටත් වෙනත් වැදගත් වැඩකට යෙදවිය හැකි කාලයෙන් සැහෙන ප්‍රමාණයක් මිඩංගු කිරීමට සිදුව තිබේ.

දූෂණ විරෝධියෙක් ලෙස මාගේ පෞද්ගලික ක්‍රියාකාරිත්වය හා ඒ පිළිබඳ සමාජ මැදිහත්වීම්වල ඉතිහාසය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ඉතිහාසයට වඩා පැරණිය. රටේ සිදුවෙමින් පැවැති බොහෝ දේ ගැන කළකිරීමට හා අරගල කිරීමෙන් විඩාවට පත්ව සිටි පුරවැසියෙකු හා විකල්ප ධාරාවේ පුවත්පතක ජනමාධ්‍යවේදියෙකු වශයෙන් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ශාඛාවක් ශ්‍රී ලංකාව තුළ ඇරඹෙන බව දැනගන්නට ලැබී එවකට මා කර්තෘ මාණ්ඩලිකයෙකු වශයෙන් සේවය කළ රාවය පුවත්පතට ඒ පිළිබඳ ප්‍රවෘත්තියක් ලියූ බව මට මතකය. එසේම ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ප්‍රථම වරට පැවැත්වූ ජාතික සුපිළිපන් ප්‍රණාම උළෙලට සහභාගිවීමෙන් ලද ආශ්වාදයෙන් ඒ පිළිබඳවද රාවය පුවත්පතට සංවේදී සටහනක් ලියූ බවද මේ මොහොතේ මට සිහිපත් වේ. රටේ දූෂණ මැඩලීමට තවත් සවිමත් සංවිධායක් එක්වීමේ ප්‍රීතියද ඒ හා මුසුව තිබිණි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට සම්බන්ධවීමට පෙර මම ආයතනයේ දැක්ම සහ මෙහෙවර ගැන විශේෂ අවධානයක් යොමු කළ අතර එවැනි දැක්මක් සහ මෙහෙවරක් වෙනුවෙන් දායකවීමට ලැබීම ඒ මොහොතේ සමාජ මෙහෙවරකට දායකවීමක් සේ සැලකුවෙමි. කාර්ය මණ්ඩලයේ කාර්ය සාධන ඇගයීම් වැනි අවස්ථා කිහිපයකදීම මා ඒ බව මීට පෙරද ප්‍රකාශ කොට තිබේ.

ගරු සභාපතිතුමනි,

ආයතනයට සම්බන්ධවීමට පෙර මාගේ පෞද්ගලික අධ්‍යන හා එම විෂය පිළිබඳව විවිධ වැඩසටහන්වලට සහභාගිවීම මගින් ''දූෂණය" පිළිබඳ සැළකිය යුතු දැනුම්වත්භාවයක් මා ලබා සිටි අතර ආයතනයට සම්බන්ධවීමෙන් පසු තවත් බොහෝ අලුත් විෂයන් සමඟ දූෂණය සම්බන්ධයෙන් ද වඩාත් පුළුල් දැනුමක්, අවබෝධයක් ලබාගැනීමට අවස්ථාවන් ලැබිණි. ඒ සමස්ථ දැනුම, අවබෝධය භාවිතා කරමින්, අකටයුතුනාදකයන් වශයෙන් අප ඉදිරිපත් කළ මුල් චෝදනා හා මෙම ලිපිය මගින් මා ඉදිරිපත් කර ඇති කරුණු දෙස මධ්‍යස්ථව හා විචාරශීලීව නැවත නැවතත් බැලූ විට මට හැඟී යන්නේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් නිර්වචනය අනුව මේවා ''දූෂණ" යටතට වැටෙන වැරදි බවය. පසුගිය කාලය තුළ සමාජයේ විවිධ ස්ථර නියෝජනය කරන 3000-4000ක පමණ පිරිසක් (අවම වශයෙන්) සමඟවත් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය නියෝජනය කරමින් හා පුහුණුකරුවෙකු වශයෙන් දූෂණය, එහි ප්‍රභේද හා ප්‍රතිවිපාක පිළිබඳව මා සතු දැනුම බෙදා හදාගෙන ඇති බැවින් මෙම තත්ත්වයන් දූෂණ නොවන්නේ නම් එම පිරිස් ආමන්ත්‍රණය කරමින් මා ප්‍රකාශ කළ අදහස් නිවැරදි කළ යුතුව තිබේ.

පසුගිය කාලය තුළ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය, දූෂණ විරෝධී සංධානය සමඟ එක්ව සිදුකළ අකටයුතු නාදකයින්ගේ ආරක්ෂාව සඳහා සුදුසු ප්‍රතිපත්තියක් සැකසීමේ කාර්යයේදී අපට මුහුණදීමට සිදුවූ ප්‍රමුඛතම ගැටලුවක් වූයේ ''රජු වරදක් නොකරයි" යන පදනම මත නිර්මාණය වී ඇති අකටයුතු නාදකයන්ගේ ප්‍රතිපත්තිය වැනි සංකල්පයක් ශ්‍රී ලංකාව වැනි බොහෝ ආයතන හා පද්ධති දැඩි පරිහානියට හා දූෂණයට ලක්ව ඇති රටක් තුළ ක්‍රියාවට නංවන්නේ කෙසේද? යන්නයි. අපද එම සමස්ථ කාර්යය තුළ කටයුතු කළේ හෘද සාක්ෂිය සමඟ බලවත්

ගැටුමකින් යුතුව බව සභාපතිතුමන් වශයෙන් ඔබට මේ අවස්ථාවේ ප්‍රකාශ කළ යුතුව තිබේ. එම වකවානුව තුළ පුවත්පත්වල පළවූ කරුණු සම්බන්ධයෙන් ආයතනය කිසිදු ප්‍රතිචාරයක් නොදක්වා තිබූ තත්ත්වයක් තුළ කවර හෝ මොහොතක අපටද ඇඟිල්ලක් දිගුවනු ඇතැයි හැඟීමක් එම කාර්යයේ යෙදුන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ කණ්ඩායම ලෙස අප තුළද පැවතිණි.

''අකටයුතුනාදකයෙකු" ලෙස මෙය ඔබට ලියන අවසන් ලිපිය වීමට බොහෝ දුරට ඉඩ තිබේ. එම නිසා අවසන් වශයෙන් එක් කරුණක් කෙරෙහි ඔබගේ දැඩි අවධානය යොමු කරවන මෙන් ඉල්ලා සිටිමි.

අකටයුතු නාදකයන් වශයෙන් අප විධායක අධ්‍යක්ෂවරයාට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනාත්, මා මෙම ලිපිය මගින් ඉදිරිපත් කර ඇති කරුණුත් සම්බන්ධයෙන් මගේ හෘද සාක්ෂියට එකඟව පිළිගත හැකි, සාධාරණ ප්‍රතිචාරයක් ලැබෙන තුරු මට විධායක අධ්‍යක්ෂවරයා යනු දූෂණ චෝදනාවන්ට ලක්වූවෙකි. විධායක අධ්‍යක්ෂවරයා ඉදිරි සතිය තුළ (ජූලි 31ට පෙර) මා සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්දැයි අපැහැදිලි නමුත් මා සම්බන්ධයෙන් ඔහු දරන ආකල්පය කෙබඳුදැයි මේ වන විට ඉතා පැහැදිලිය.

පෙර සඳහන් කළ පරිදි අකටයුතු නාදනය පදනම්වී ඇත්තේ ''රජු වරදක් නොකරයි" යන මූලික සංකල්පය මත බැවින් අකටයුතු නාදකයෙකු සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමට දූෂණ චෝදනාලාභී චූදිතයෙකුට ඉඩ දීම ස්වාභාවික යුක්තියේ මූලධර්මයන්ට පටහැනිය.

එබැවින් විධායක අධ්‍යක්ෂවරයාට එරෙහි දූෂණ/අක්‍රමිකතා චෝදනා සම්බන්ධ විමර්ශනයෙන් ඔහු වැරදිකරුවෙකු හෝ නිවැරදිකරුවෙකු බව තීරණය වන තෙක් චූදිතයෙකු වන ඔහුට අකටයුතු නාදකයෙකු සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ සදාචාරාත්මක අයිතියක් තිබිය නොහැකිය. ඒ සම්බන්ධයෙන් සුදුසු මැදිහත්වීමක් කිරීම ආයතනයේ සභාපතිවරයා වශයෙන් ඔබ සතු යුතුකමක් මෙන්ම වගකීමක් ලෙසද මම සලකමි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය මෙම අප්‍රසන්න තත්ත්වයෙන් මුදවා, රටේ දූෂණ පිළිබඳව ක්‍රියාත්මක වන සැබෑ සුපිළිපන් ආයතනයක් බවට පත්කිරීමට ගරු සභාපතිවරයා වශයෙන් ඔබට සියලු ශක්තිය හා ධෛර්යය හිමිවේවා.

ස්තුතියි!

මෙයට

විශ්වාසී

ආනන්ද ධර්මප්‍රිය ජයසේකර

(මෙම ලිපිය අකටයුතුනාදකයන් වෙනුවෙන් අපගේ ලිපියට අස්සන් තැබූ සෙසු කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනාටද විද්‍යුත් තැපැල මගින් යවන බව කාරුණිකව දන්වමි.)